# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


Article 12 (1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019 - 05 - 23 |

පැමිණිලිකරු : එන්.එස්.බී. මල්ලවආරච්චි මහතා,
අංක 113.විහාර මාවත,
සුදුහුම්පල, මහනුවර.

වගඋත්තරකරුවන් : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : HRC/K/728/16</u>

**පැමිණිල්ලේ සැලකිරීම :-**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරිමට අදාළව රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මන්ඩල/රාජ්‍ය බැංකු නිලධාරින්ගේ දරුවන් ගණය යටතේ මහ/කිංස්වුඩ් විද්‍යාලයට අයදුම්පතක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 88 ක් ලබාගත් නමුත් ළමුන් තෝරාගත් නාමලේඛනයේ තම දරුවාගේ නම ඇතුළත් වී නොතිබූ බවත්, තමාගේ දරුවා ලකුණු 88 ලබාගෙන තිබියදීත් ලේඛනයේ ඊට වඩා අඩු ලකුණු ලැබුවන් පොරොත්තු ලේඛනයට ඇතුළත්ව තිබූ බවත්, තමා ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය විදුහල්පතිගෙන් විමසූ විට තමා අදාළ ලිපිනයේ පදිංචිව නොසිටි බැවින් නම ඇතුළත් වී නොමැති බවට සඳහන් කරන ලද බවත් දක්වා ඇත.

තමා වසර 05ක පමණ කාලයක සිට බිරිඳගේ පුංචි අම්මාගේ නිවස වන ඉහත ලිපිනයේ පදිංචිව සිටින අතර, තමාගේ බිරිඳ වසර 05ක සිට එම ලිපිනයේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති බවත් තමාද පසුගිය වර්ෂයේ සිට එහි ඡන්ද ලියාපදිංචි නාමලේඛනයේ ඡන්ද දායකු බවත්, සම්මුඛ පරික්ෂණයට අදාළව ස්ථාන පරික්ෂාව සඳහා නිලධාරින් පැමිණෙන අවස්ථාව වන විට තමාගේ බිරිඳගේ මවට හෘද සැත්කමක් කිරිම හේතුවෙන් ගම්පොල පිහිටි නිවසට තාවකාලිකව ගොස් සිටි බවත්,මේ පිළිබඳව තමා අභියාචනයක් ඉදිරිපත් කිරිමෙන් පසු අභියාචනා මණ්ඩල පරික්ෂාවට ඉදිරිපත් වී මුලින් දුන් ලකුණු 88 ලබාදිමට කටයුතු කළ බවත් සඳහන් කර

ඇත. පදිංචිය තහවුරු කරගැනිම සඳහා ස්ථාන පරික්ෂාවට නැවත එන බව දැන්වුවද කිසිවෙක් නිවසට නොපැමිණි බවත්, අවසන් ලේඛනය ප්‍රදර්ශනයේදී තමාගේ දරුවාගේ නම ඇතුලත්ව නොතිබූ බවත් දක්වා ඇති අතර, තමාගේ දරුවා මෙම පාසලට ඇතුළත් කිරිමට අදාළ අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙසට ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවීය සැලකිරිම් :-

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුලත් කිරිමට අදාළව ස්ථාන මාරු ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, සම්මුඛ පරික්ෂණයේදී පැමිණිලිකරු ලකුණු 88 ක් උපයාගෙන ඇති බවත්, ඉන් අනතුරුව අයදුම්කරුවන්ගේ පදිංචිය භෞතිකව සනාථ කරගැනිමට කරන ලද ස්ථාන පරික්ෂණයේදී පැමිණිලිකරු අදාළ ස්ථානයේ පදිංචි නොමැති බවට නිරික්ෂණය වී ඇති බවත්, එම තත්ත්වය මත පැමිණිලිකරුගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් නොකළ බවත් සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා පරික්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලි පාර්ශවය සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරික්ෂණයට පෙනි සිට ලකුණු 88ක් ලබාගෙන ඇති නමුත් දරුවා පාසලට ඇතුළත් කර නොගැනිම සම්බන්ධයෙන් උක්ත පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. පදිංචිය තහවුරු කර ගැනිම සඳහා ස්ථාන පරික්ෂණය සිදුකරන අවස්ථාවේ පැමිණිලිකරු පදිංචි ස්ථානයේ නොසිටියද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ අභියාචනයට අනුව අභියාචනා පරික්ෂණයේදී නැවත ස්ථාන පරික්ෂණයක් සිදුකළ යුතු බව අභියාචනා මණ්ඩල සභාපති විසින් සටහන් කර ඇති නමුත් ස්ථාන පරික්ෂණයක් සිදුකර නොමැති බව නිරික්ෂණය වේ. පාසල් වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ 2016.05.16 දිනැති අංක 17/2016 දරණ චක්‍රලේඛනයේ 10.10 වගන්තිය අනුව අභියාචනා පරික්ෂණවලදී නැවත පදිංචිය පිළිබඳ ස්ථාන පරික්ෂණ සිදුකිරිම අභියාචනා මණ්ඩලයේ වගකිම වුවද අභියාචනා මණ්ඩලය එම වගකිම පැහැර හැර ඇති බව නිරික්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු කර නොගෙන පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවන බවට තිරණය කර අවශ්‍ය ලකුණු ලබාගෙන තිබෙන පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර නොගැනිම තුළින් පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බවද නිරික්ෂණය වේ. එසේම අභියාචනා පරික්ෂණ මණ්ඩලය නැවත ස්ථාන පරික්ෂාවක් සිදුකල බවට තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරිමට අපොහොසත් වී ඇත.

නිගමනය :-

පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත්වීමට අවශ්‍ය ලකුණු ලබාගෙන තිබියදි පදිංචිය තහවුරු කර ගැනිමට සිදුකළ පරික්ෂණයේදී පැමිණිලිකරු නිවසේ නොසිටියද

නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදුකරන බව ප්‍රකාශ කළද නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදුනොකරම පදිංචිය තහවුරු නොවූ බවට සලකා පැමිණිලිකරුගේ දරුවා තෝරා නොගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2018 වර්ෂයේ 2 වන ශ්‍රේණියට (2019 වර්ෂයේ 3 වන ශ්‍රේණියට) ඇතුළත් කර ගැනීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළ යුතුය.

2019. 06 .21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/